රොක්බෑන්ක්හි පාරමිතා බෞද්ධ විහාරවාසී,
මහනුවර අස්ගිරි මහාවිහාර මහ පිරිවෙණේ ආචාර්ය,
ඉඳිපරපේ ධම්මසිරි හිමි



# බුදුමග යන්නට බුදුබණ ඇසුමට පින් කෙරුවා අපි සසර පුරා බුදුගුණ මහිමය පැතිරේවා සංසාරේ දුක නිවෙන තුරා

"දුල්ලභං ච මනුස්සත්තං බුද්ධුප්පාදෝ ච දුල්ලභෝ
දුල්ලභා ඛණ සම්පත්ති සද්ධම්මෝ පරම දුල්ලභෝ."
(මිනිසත් බව ලැබීම ද, බුදුවරයෙකුගේ පහළ වීම ද, ක්ෂණ සම්පත්තිය හෙවත් පින් කිරීමට ලැබෙන අවස්ථාව ද දුර්ලභය. සද්ධර්මය පරම දුර්ලභය.)

සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේ පන්සාළිස් වසක් මුළුල්ලේ ලෝක සත්ත්වයාගේ හිතසුව පිණිස දේශනා කළ සත්‍ය වූ ධර්මය අවබෝධ කරගෙන මේ වෙසක් පුන් පොහොයට වසර 2603 ක් සම්පූර්ණ වේ. ආරම්භයක් හෝ අවසානයක් සිතන්නට බැරි මේ දීර්ඝ වූ සසරෙහි ඇතැම් විට අපට බුදුරදුන් දකින්නට, බණ අසන්නට අවස්ථාව ලැබුණා විය හැකිය. එහෙත් තවමත් අප විවිධ දුක්ඛ දෝමනස්සයන්ට මුහුණ දෙමින් සසරෙහි සැරිසරයි. මනුෂ්‍යයාගේ පරමායුෂ වසර 100 ක් ලෙස ගණනය කළ ද බුදුන් දවස සිට මේ වන විට අප විසිහය වතාවක්වත් සසරෙහි ඉපිද මැරෙමින් ගමන් කර ඇත. පූජ්‍ය රඹුකන සිද්ධාර්ථ ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පන්හිඳෙන් ලියැවුණු මේ ගීතයෙන් අපට සිහිපත් කර දෙන්නේ ද බුදුන් දකින්නට, බණ අසන්නට පින් කළ නමුත් සසර දුකින් මිදෙන්නට නොහැකි වූ බවයි.

බුදුහාමුදුරුවො අපිත් දකින්නැති බණත් අහන්නැති ඒ කාලේ
නිවන් දකින්නට පින් මදි වෙන්නැති ඒකයි තවමත් සංසාරේ

දෙව්රම් වෙහෙරට යන්න එන්න ඇති බුදුන් වඳින්නට ඒ කාලේ
නිවන් දකින්නට පින් මදි වෙන්නැති ඒකයි තවමත් සංසාරේ

අපිත් එක්ක හිටි අපේ ම යාළුවො නිවන් දකින්නැති ඒ කාලේ
මෙතේ බුදුන් දැක නිවන් දකින්නට පින් පුරවමු අපි සංසාරේ
...

බුදුරජාණන් වහන්සේ දේශනා කළේ මිනිසෙකු වී ඉපදීම විශාල පිනක් බවයි. මිනිසත් බව ලැබීම පමණක් නොව අංගසම්පූර්ණ මිනිසකු ව ඉපදීම ඊටත් වඩා කුසල බලයකි. ඇස්, කන්, නාසා ආදී ශරීරාංගයන්ගේ දුබල බවක් ඇති ව ඉපදීමෙන් මිනිසත් බවෙහි වටිනාකම අඩුවේ. එබැවින් අප සිතා බැලිය යුත්තේ දුර්ලභ වූ මනුෂ්‍යාත්මයක් ලබාගෙන එය වඩාත් සාර්ථක ව, තමාටත් අනුන්ටත් වැඩදායක ලෙස අර්ථසම්පන්න ව ගත කරන්නේ කෙසේ ද යන කාරණයයි. කෝට්ටේ යුගයේ ලියැවුණු ලෝවැඩ සඟරාවේ කතුවර වීදගම මහාමෛත්‍රිය හිමියන් අප මුලින් දැක්වූ බුද්ධදේශනාව ගැන කවියෙන් පැහැදිලි කළේ මේ ආකාරයෙනුයි.



කලෙකිනි බුදු කෙනෙකුන් උපදින්නේ
දුකකිනි මිනිසත් බව ලැබගන්නේ
මෙදෙකිනි මෙසසර දුක් දුරලන්නේ
සුදනෙනි කිම විරිය නොකරන්නේ

මිනිසත් බව ලැබූව ද බුද්ධෝත්පාද කාලයක උපත ලැබීමට නොලැබෙන්නේ නම් කුසල් කරගන්නට, දහම වඩන්නට අවස්ථාවක් නොලැබේ. බුදුවරයෙකු උපදින්නේ කල්පගණනකිනි. ඒ බුදුන් සියැසින් දැක, දහම් අසා සසර දුකින් එතෙර වන්නට ලැබෙන්නේ පෙරුම් පුරා කුසල ශක්තියෙන් අගතැන්පත් වූන්ටය. බුදුන් සියැසින් නොදුටුව ද උන්වහන්සේගේ ශ්‍රී සද්ධර්මය පවත්නා තාක් අපට දහම් මග යන්නට, පින් සිදුකරගන්නට කිසිදු බාධාවක් නැත. මිනිසත් බවේ වටිනාකම තේරුම් නොගෙන මේ ජීවිතය පවින්, අකුසල්වලින්, වැරදිවලින් කෙලෙසා ගත්තොත් නිසක ව ම දුගතිගාමී වෙයි. එහෙයින් ලැබූ මිනිස් දිවිය සම්පූර්ණ කරගන්නට නම් නොපමා ව කුසල් දහම් කළ යුතුය. සසර දුක් නිවාගන්නට වීර්යය කළ යුතුය.

පස්පව් කොට මෙතැනත් ලැබ සෝකය
ගොස් නිරයේ දුක් විඳිති අනේකය
රැස් කොට ඉන් පින් මෙමිනිස් ලෝකය
සිස් නොකරව් කලෙකින් ලත් මේ කය

දුක යනු පවෙහි ප්‍රතිඵලයයි (දුක්ඛෝ පාපස්ස උච්චයෝ). සැප යනු පිනෙහි ප්‍රතිඵලයයි (සුඛෝ පුඤ්ඤස්ස උච්චයෝ) එහෙයින් අප විසින් සිදු කළ යුත්තේ දක්ෂ මල්මාලාකරුවෙක් මනරම් මල්දමක් ගොතන්නාක් මෙන් කුසල් කරමින් ලැබූ මිනිස් දිවිය සාර්ථක කර ගැනීමයි.

යථාපි පුප්ඵරාසිම්හා කයිරා මාලා ගුණෝ බහූ
ඒවං ජාතේන මච්චේන කත්තබ්බං කුසලං බහු.

අප මල්මාලාවක් ගොතන විට පළමුවෙන් ම කරන්නේ මල් එකතු කර ගැනීමයි. ඉන්පසු ව හොඳ මල් සහ තැලුණු, පොඩිවුණු පෙති ගැලවුණු, සුවඳ නැති මල් වෙන් කර ගැනීම සිදු කරයි. ඊළඟට හොඳ මල් විවිධ වර්ණ, විවිධ ප්‍රමාණයන් අනුව වෙන වෙන ම ගොඩවල්වලට වෙන් කර ගනියි. මල් ඇමිණිය යුතු ආකාරය පිළිබඳ සැලසුම සිතින් මවාගෙන ඒ පිළිවෙලට ලස්සනට, එකින් එක මල්දම සකස් කරයි. අපේ ජීවිතත් මල් ගොඩක් හා සමානයි.




පොත පත දෙසට හෙලන විමසුම් ඇස
"සාහිත්‍ය සම්භාෂණ"

ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන
ජගත් ජේ එදිරිසිංහ සමග දිල්රුක්ෂි දිනේෂා ජයසූරිය ඉදිරිපත් කරන
"සාහිත්‍ය සම්භාෂණ" එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන් සෑම
මසකම අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.
අන්තර්ජාලයෙන් ඇසීමට
http://www.sbs.com.au/yourlanguage/sinhalese/

සන්නස Cartoon by PK




සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර www.thisara.com